# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1981/21 – 2016 අගෝස්තු 22 වැනි සඳුදා – 2016.08.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/22/04/2010.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2010.12.07 වැනි දින අංක 1683/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2010.11.19 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඩී. ජී. විජේරත්න මයා, අංක 187/2, තොටුපලවත්ත, අලවතුගොඩ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, අංක 20, වෝඩ් පෙදෙස, කොළඹ 07.

අතර පවත්නා 2010.11.08 වැනි දින දරන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් එම්. ආරිෆ් මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය, අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2010.11.19 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 අගෝස්තු මස 16 වැනි දින,
කොළඹ දී ය.

09 – 215/1

1A – G 24070 –52(2016/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/22/04/2010.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඩී. ජී. විජේරත්න මයා, අංක 187/2, තොටුපලවත්ත, අලවතුගොඩ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, අංක 20, වෝඩ් පෙදෙස, කොළඹ 07.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, තලවතුගොඩ, නුගේගොඩ පාරෙන් එහා, එකමුතු මාවත, අංක 570/බී/1 හි පී. නවරත්න මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 අගෝස්තු මස 16 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/22/04/2010.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඩී. ජී. විජේරත්න මයා, අංක 187/2, තොටුපලවත්ත, අලවතුගොඩ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, අංක 20, වෝඩ් පෙදෙස, කොළඹ 07.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ –

''පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ මාණ්ඩලික සහකාර (පොත් තබන්නා) තනතුරෙහි සේවයේ යොදවා සිටි ඩී. ජී. විජේරත්න මහතාට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ලබා දුන් සහකාර අභ්‍යන්තර විගණක තනතුරට උසස් කිරීම 2008. 02. 05 දිනට පෙරදාතම කරන මෙන් හා එකී තනතුර සහකාර මුල්‍යාධිකාරී වශයෙන් සංශෝධනය කර ඒ අනුව අදාළ හිඟ වැටුප් හා වෙනත් දීමනා ලබා දෙන ලෙසට ඔහු විසින් කරන ලද ඉල්ලීම යුක්ති සහගත ද යන්න හා යුක්ති සහගත වන්නේ නම් ඩී. ජී. විජේරත්න මහතාට ලැබිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.''

**එම්. ඩී. සී. අමරතුංග,**
කම්කරු කොමසාරිස්.

2016 ජූලි මස 25 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

09 – 215/2

මගේ අංකය: IR/COM/01/W/2015/141.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

පී. එච්. ජී. අමිල මහීපා ශිලන්ත මයා, අංක 08, පිලදූව පටුමග, උයන්වත්ත දකුණ, මාතර.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුල පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බොරලැස්ගමුව, අබේරත්න මාවත, අංක 28, එස්. කාරියවසම් මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 අගෝස්තු මස 16 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/W/2015/141.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

පී. එච්. ජී. අමිල මහීපා ශිලන්ත මයා, අංක 08, පිලදූව පටුමග, උයන්වත්ත දකුණ, මාතර.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුල පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ –

''ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මාතර ඩිපෝවේ කම්කරුවෙකු ලෙස සේවයේ කරනු ලබන පී. එච්. ජී. අමිල මහීපා ශිලන්ත මහතා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ තංගල්ල ඩිපෝවේ සේවය කරමින් සිටියදී 2012. 04. 09 දින හෝ ඊට ආසන්න දිනයකදී සිදු වූ කලහකාරී ක්‍රියාවක් සම්බන්ධයෙන් 2012. 07. 22 දතමින් යුතුව ඔහුට එරෙහිව චෝදනා පත්‍රයක් නිකුත් කර විනය පරීක්ෂණයක් පවත්වා ඔහු වෙත ලබා දී ඇති දඬුවම් සාධාරණ හා යුක්ති සහගත වන්නේ ද යන්න සහ 2014. 07. 01 දින සිට 2014. 10. 01 දින දක්වා සේවයේ අත්හිට වූ කාලයට ඔහුහට වැටුප් නොගෙවීම සාධාරණ හා යුක්තිසහගත වන්නේ ද යන්නත් එසේ සාධාරණ හා යුක්ති සහගත නොවන්නේ නම් ඔහු හට හිමිවිය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ.''

**එම්. ඩී. සී. අමරතුංග,**
කම්කරු කොමසාරිස්.

2016 අගෝස්තු මස 2 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

09 – 216

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.